මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01
ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01
இலங்கை
The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/1/3/0-2019-i
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.06. 17

අයවැය චක්‍රලේඛ අංක: 04 /2019

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**රාජ්‍ය වියදම් දැරීමේ විචක්ෂණශීලීභාවය වර්ධනය කිරීම - 2019**

2019 අයවැය කථාවේ දැක්වෙන පරිදි 2019 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් වලින් සියයට 15 ක් ඉතිරිකිරීම් ලෙස හඳුනාගෙන කටයුතු කිරීමට දැනටමත් අමාත්‍යාංශ වෙත උපදෙස් ලබාදී ඇත.

02. මෙයට අමතරව 2019 අප්‍රේල් මස රටේ ඇති වූ අනපේක්ෂිත සිදුවීම් මත ආර්ථික කටයුතුවලට බාධා එල්ල වීම කරණ කොට රාජ්‍ය ආදායමට එල්ල වී ඇති අහිතකර පීඩනය පිළිබඳව සලකා බලා ස්වකීය ආයතන වල වියදම් දැරීමේදී වඩාත් අරපිරිමැසුම්දායී හා නාස්තිය අවම වන විධිවිධාන කෙරෙහි සියළු ආයතන ප්‍රධානීන් තම පෞද්ගලික අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම විදුලිබල සැපයුම, ජල සැපයුම, දුරකථන සේවා, ඉන්ධන, මිලදී ගැනීම් සහ අනෙකුත් ගිවිසුම්ගත සේවාවන් සම්බන්ධයෙන් විධිමත් වියදම් පාලන ක්‍රම යොදා ගැනීම තුලිනුත්, එම සේවා උපයෝජනය පිළිබඳ පසුවිපරම් කිරීම තුලිනුත්, කාර්යාලයීය අවශ්‍යතා මිලදී ගැනීම ආදියෙහි වියදම් පාලනයක් අවශ්‍යය. අතිරේක වියදම් නොදැරීම හා කල්දැමිය හැකි වියදම් කල් දැමීමට හා අමතර වියදම් තත්‍යානුරූප කිරීමෙන් පුනරාවර්තන වියදම් අඩුකර ගැනීමට කටයුතු කළයුතු වේ. ඒ අනුව, පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කළයුතු බව දන්වනු කැමැත්තෙමි.

(i) ඉන්ධන, දුරකථන, ගමන් වියදම් සම්බන්ධ ගෙවීම් කිරීමේදී ඒ ඒ වියදමට අදාළ වන්නාවූ රාජ්‍ය පරිපාලන හා අනෙකුත් චක්‍රලේඛ උපදෙස් තරයේ පිළිපැදිය යුතු අතර, චක්‍රලේඛ උපදෙස් වලට පරිබාහිරව කිසිදු ගෙවීමක් සිදු නොකිරීමට වගබලාගත යුතුය.

(ii) විදුලි වියදම් අවම කිරීම සඳහා සුදුසු පාලනයක් ක්‍රියාත්මක කළයුතු අතර, සෑමවිටම අනවශ්‍ය විදුලි පහන්, විදුලි පංකා ක්‍රියාවිරහිත කිරීමේ ක්‍රමවේදයක් ආයතනය තුළ ඇති

කිරීමට කටයුතු කළයුතුය. සියයට 5 ක විදුලි බිලෙහි ඉතිරියක් ඇතිකිරීම අරමුණු කරගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වන වගකීම නිශ්චිත නිලධාරියෙකු වෙත පවරා ඒ පිළිබඳව මාසිකව ප්‍රගතිය සොයා බැලීමට කටයුතු කළයුතුය.

(iii) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වල අතිකාල ගෙවීමේදී විශේෂයෙන්ම පැය ගණන ගණනය කිරීමේදී සහ ගෙවීම් අනුපාතිකයන් අදාළ කරගැනීමේදී අතිකාල විෂයය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ හා වරින්වර නිකුත් කර ඇති චක්‍රලේඛ වල සඳහන් විධිවිධාන තරයේ පිළිපැදිය යුතුය. ඔබගේ අධීක්ෂණය යටතේ ඇති සියළුම අංශවලට/ඒකකවලට/සංවිධානවලට ඒ අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදිය යුතුය.

(iv) ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වැය විෂයය යටතේ මිලදී ගැනීම් සිදුකිරීමේදී අනවශ්‍ය පරිදි තොග රඳවා තබා ගැනීම අවම කරමින් හැකිතාක් දුරට පවත්නා ලිපිද්‍රව්‍ය තුළින් අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කළයුතුය. ඊළඟ වර්ෂය සඳහා දිනපොත් මුද්‍රණය, ලිත්/කැලැන්ඩර් ආදිය මුද්‍රණය කිරීම සඳහා රජයේ අරමුදල් යොදා නොගත යුතුය.

(v) ජාතික අයවැය චක්‍රලේඛ 3/2019 හි 6 ඡේදය මගින් විදේශ සංචාර/අධ්‍යයන චාරිකා සම්බන්ධ වියදම් හැකිතාක් අවම කිරීමට දැනටමත් උපදෙස් ලබාදී ඇත. මෙහිදී විශේෂයෙන් දේශීය අරමුදල් භාවිතා කරමින් සංවිධානය කරන විදේශ අධ්‍යයන චාරිකා අත්හිටුවීමට කටයුතු කළයුතු අතර, ශ්‍රී ලංකාව වෙනුවෙන් යම් නිල වශයෙන් /රාජකාරිමය නිශ්චිත සහභාගිත්වයක් අත්‍යවශ්‍ය නොවන්නේ නම් දේශීය අරමුදල් මගින් වියදම් දරමින් සම්මන්ත්‍රණ/වැඩමුළු ආදිය සඳහා නිලධාරීන් සහභාගී නොකළ යුතුය.

03. රටේ සංවර්ධන අරමුණු සහ ඉලක්ක ඉටුකර ගැනීම සඳහා මූල්‍ය විනයක් ඇතිකර ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, ඉහත කරුණු කෙරෙහි ඔබගේ පෞද්ගලික අවධානය යොමුකර කටයුතු කරන මෙන් දැනුම්දෙමි.

04. මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා ඔබගේ සහයෝගය උදක්ම අපේක්ෂා කරමි.

ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත: විගණකාධිපති